බලංගොඩ අධ්‍යාපන කලාපය

7 ශ්‍රේණිය නර්තනය

## කරගම්

- ලාංකේය වතුකර ද්‍රවිඩ ජනයා අතර ද පවතින සාම්ප්‍රදායික ජන නැටුම් විශේෂයක් ලෙස ද මෙම කරගම් නැටුම් දැක්විය හැක.

- පුද ලබන දෙවිවරු ලෙස මාරි අම්මාන්, ගංගා අම්මාන්, කාලි දෙවියන්, මුරුගන් දෙවියන්, පත්තිනි දෙවියන් හඳුන්වාදිය හැක.
- අගෝස්තු මාසය තුළ ඉන්දියාවේ හා ලංකාවේ පැවැත්වෙන උත්සවයකි.
- දේව භක්තිය ප්‍රකාශ කිරීම, ආශීර්වාදය ලබා ගැනීම, දෙවියන්ගේ ලෙඩ ලෙස සැලකෙන සරම්ප, වසූරිය වැනි ලෙඩ රෝග වලින් ආරක්ෂා වීමට මෙම උත්සවය පැවැත්වීම අරමුණු වේ.

- සමබරතාවය තබා ගනිමින් නර්තනය කිරීම මෙහි විශේෂ ලක්ෂණයයි.
- ඒ සඳහා කළයක් හිස මත තබාගෙන සරල චලන භාවිත කරයි. එය රතු, සුදු, කහ මල් වැඩි වශයෙන් අලංකාරය සඳහා යොදා ගැනේ
- කළය මුදුනේ කඩදාසි වලින් සකස් කරන ලද **ගිරවකුගේ ආකෘතියක්** දැකිය හැක
- දමිළ ලක්ෂණ පෙන්නුම් කරන සාරිය නොහොත් දිග සාය, හැට්ටය හා ආභරණ කාන්තාවන් භාවිත කරයි.
- පිරිමි ධෝතිය හා පූන නූල භාවිත කිරීම දක්නට ලැබේ.
- **නෛයඩි මේලම්** සංගීතය මෙහිදී සුවිශේෂ වේ. ඇතැම්විට ගායනය සඳහා ගීත ද යොදා ගැනේ.